# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2081/5 - 2018 ජූලි මස 23 වැනි සඳුදා - 2018.07.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට අලව්ව - පොල්ගහවෙල - පොතුහැර - ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතියේ පොල්ගහවෙල ජල ටැංකිය දක්වා මි. මි. 300 සම්ප්‍රේෂණ නල එළීම සඳහා ඉඩම් කොටසක අයිතිය අත්කර ගැනීමට අවශ්‍යව ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2018 ජූලි මස 17 වැනි දින,
අංක 35, ''ලක්දිය මැදුර''
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.
5/2/3/1400.

#### උපලේඛනය

කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගණේගොඩ (දකුණ) ග්‍රාම නිලධාරි වසමේ ගණේගොඩ (දකුණ) ගමේ පිහිටි (ඉඩමේ නම නොදනී.) ඉඩමෙන් සම්පූර්ණ ප්‍රමාණයෙන් පර්චස් 2.5 ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස ඃ

*උතුරට* ඃ ජලාශ පාර ;
*නැගෙනහිරට* ඃ මෙම ඉඩමේ ඉතිරි කොටස ;
*දකුණට* ඃ සුමංගල මාවත ;
*බටහිරට* ඃ ඩබ්. එම්. ජී. වීරසිංහ මහතාට අයිති ඉඩම.

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය* ඃ ඩී. එම්. සමන්තා රත්නමාලි මිය,
නො. 23/1, සුමංගල මාවත,
පොල්ගහවෙල.

08 - 284

1A - G 28141 — 29 (2018/07)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට පොල්ගහවෙල - පොතුහැර - අලව්ව ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතියේ හඳුගල ඝන මීටර් 800 භූගත ජල ටැංකිය හා පොම්පාගාරය ඉදිකිරීම සඳහා අතිරේක ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2018 ජූලි මස 17 වැනි දින,
අංක 35, ''ලක්දිය මැදුර''
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.
5/2/3/1401.

**උපලේඛනය**

කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක : 907, වලගම්මුල්ල ග්‍රාම නිලධාරී වසමේ හඳුගල ගමේ පිහිටි - ගලඋඩකොඹේ නැමති ඉඩමෙන් සම්පූර්ණ ප්‍රමාණයෙන් පර්චස් 23.41 ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස :

පිඹුරු අංක 4724/P4 කැබලි අංක 06 ප්‍රමාණය පර්චස් 23.41 ක් පමණ

*උතුරට* : අදාළ ඉඩමේ අංක 05 ඉඩම් කොටස සහ උක්කු අම්මාට සහ තවත් අයට අයිති කුඹුර ;
*නැගෙනහිරට* : 18/99 ඉඩමේ අංක 01 ඉඩම් කොටස ;
*දකුණට* : බුලුගොල්ල දොඹේමඩ මාර්ගය සහ 18/99 ඉඩමේ අංක 01 ඉඩම් කොටස ;
*බටහිරට* : අදාළ ඉඩමේ අංක 05 ඉඩම් කොටස

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය* : බී. ආර්. කීර්ති බණ්ඩාර බස්නායක
හඳුගල,
පොතුහැර.

08 - 285

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.